**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ

වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.139,610,519 ක වත්කම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් තක්සේරු වාර්තා, යාවත්කාලීන ලේඛන, උප ලේඛන සහ යාවත්කාලීන ස්ථාවර වත්කම් ලේඛන, ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ගොඩනැඟිලි තක්සේරු කර නිවැරදි වටිනාකම ඉදිරියේදී ගැලපීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති , රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 149 වගන්තිය | ප්‍රාදේශීය සභාව විසින් හඳුනාගත් සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 4කින් බදු මුදල් අයකරගෙන නොතිබුණි. | බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාවට ලැබිය යුතු ආදායම් අයකරගත යුතුය. |
| (ආ) | 1992 අගෝස්තු 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/92 | සභාවට අයත් වාහන 08 ක රාජ්‍ය ලාංඡනය යෙදීමට අමතරව ආයතනයේ නම වාහන බඳෙහි සටහන් කර නොතිබුණි. | ලාංඡන මුද්‍රණය කිරීමට මිළගණන් කැඳවීමට කටයුතු කර ඇති බව. | අදාළ චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන ගැසට් පත්‍රය | ප්‍රාදේශීය සභා සීමාව තුළ ක්‍රියාත්මක කර තිබුණු කර්මාන්ත 14 ක් සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | කර්මාන්ත 12 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමට ලිපි යොමු කර ඇති බව. | චක්‍රලේඛ හා විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,806,732 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 9,813,638 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්ත මේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්ත මේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 604,950 | 665,800 | 407,036 | 258,763 | 557,670 | 600,143 | 454,741 | 145,402 |
| (ii) | කුලී | 216,000 | 5,592,310 | 5,592,310 | - | - | - | - | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 350,000 | 423,750 | 423,750 | - | 350,000 | 357,800 | 357,800 | - |
| (iv) | වෙනත් ආදායම් | 6,584,000 | 12,821,541 | 6,297,651 | 6,523,890 | 2,750,000 | 6,529,359 | 5,521,965 | 1,007,394 |
| | **එකතුව** | **7,754,950** | **19,503,401** | **12,720,747** | **6,782,653** | **3,657,670** | **7,487,302** | **6,334,506** | **1,152,796** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අක්‍රීය වූ ජල ව්‍යාපෘති වලින් 2018 වර්ෂයේ සිට අයවිය යුතු රු.480,055 ක ජල ගාස්තු අය කර ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විෂය භාර අමාත්‍යවරයා වෙත ලිපි යොමු කිරීමට කටයුතු කරමින් පවතින බව. | කාලීනව හිඟ ආදායම් අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 15,973,977 ක් හා මුද්දර ගාස්තු රු.12,803,419 ක් ගෙන්වාගෙන නොතිබුණි. | හිඟ අයකර ගැනීමට ආණ්ඩුකාරතුමාට ලිපි යොමු කර ඇති බව. | හිඟ හිටි ආදායම් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. පනතින් පවරා ඇති කාយර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේදී සංචාරක අමාත්‍යංශයේ සහ LDSP ව්‍යාපෘතියේ ප්‍රතිපාදන වලින් රු.26,833,705 ක් වැය කර 2023 වර්ෂයේදී පොරෝගල සංචාරක මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු අඩක් නිමකර නැරඹුම් මධ්‍යස්ථානයක් වශයෙන් මහජනතාවට විවෘත කර තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළව ව්‍යාපෘති යෝජනාවක් මත මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සහ විධිමත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, විවිධ අවස්ථා වලදී ඉදිකිරීම් සිදු කරමින් තිබුණි. | දැනට සම්පූර්ණ භූමිය සඳහා විධිමත් සැලැස්මක් සකස් කර ඇති බව. | දීර්ඝ කාලීන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා විධිමත් සැලැස්මක් සකස් කර එය අනුමත කරගත යුතු අතර ඒ අනුව කටයුතු කළ යුතුය |

### 3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂ විසින් සභාවට ලබාදුන් ගිලන් රථයේ අයිතිය පවරා නොගෙන අලුත්වැඩියාව වෙනුවෙන් රු.1,250,427 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ගිලන් රථය අරමුණුගත කාර්ය වෙනුවෙන් යොදවාගෙන නොතිබුණි. | ගිලන් රථය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව . | වත්කමේ අයිතිය සභාවට පවරාගෙන අරමුණුගත කාර්ය වෙනුවෙන් යොමු කළ යුතුය. |
| (ආ) | 1956 වර්ෂයේදී හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් අක්කරයක පමණ විශාල භූමියක සභා ගොඩනැඟිල්ලක්, පුස්තකාලයක් සහ පෙර පාසැල් ගොඩනැඟිල්ලක් ඉදිකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය නිරවුල් කරගත යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) ප්‍රතිපාදන උපයෝගී කරගෙන කසළ කළමනාකරණය සඳහා කන්ටේනර් බහාලුම් 02 ක් රු. 3,975,000 කට මිලදීගෙන තිබුණද, අදාළ කාර්ය සඳහා භාවිත කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයට කසළ ගෙනවිත් භාරදීමට ප්‍රදේශවාසීන්ගේ උනන්දුවක් නොමැති බව. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත මිලදී ගෙන තිබුණු රු.3,450,000 ක් වූ ජංගම වෙළඳ කුටි 05 ක් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | අදාළ ගැනුම්කරුවන්ට ලබාදීමට කටයුතු කර ඇති බව. | ජංගම වෙළඳ කුටි අරමුණුගත කාර්යය සඳහා භාවිතා කළ යුතුය. |
| (ඇ) | 2016 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය අනුග්‍රහය යටතේ පුරනැගුම ව්‍යාපෘතියට සමගාමීව රු. මිලියන 400 ක් වැයකර වැඩ නිමකර තිබුණු බණ්ඩාරවෙල හීල්ඔය බහුකාර්ය ගොඩනැගිල්ල, පුස්තකාලය, සතිපොළ හා වැසිකිළි පද්ධතිය යෝජිත කාර්ය සඳහා භාවිත කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | බහුකාර්ය ගොඩනැගිල්ලක් ලෙස භාවිතා කරමින් පවතින බව. | මහජන මුදල් ඵලදායිව සහ කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් සුසාන භූමි 55ක් හා ක්‍රීඩා පිටියක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කරන බව. | වත්කම් විධිමත් තක්සේරුවක් කර ගිණුම්ගත කළ යුතුය. |